# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 2044/22 - 2017 නොවැම්බර් මස 07 වැනි අඟහරුවාදා - 2017.11.07**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය:* 4-3/15/2015/VE/24.
*ඉඩම් අමාත්‍යාංශයේ අංකය:* ATU/LND/04/DO 12.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශ්‍යතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීම පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශ්‍යතාවේ විස්තර* :

මාතර දිස්ත්‍රික්කයේ ගඟබඩ පත්තුව උතුර, අතුරලිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උග්ගස්හේන ගමේ පිහිටි මාතර සර්වේ ජනරාල්ගේ අ.ග.පි. 87 අතිරේක අංක 43 දරන අවසාන ගම් පිඹුරේ පෙන්නුම් කරන පහත දැක්වෙන ඉඩම:

**01. කැබලි අංක 696**

ඉඩමේ නම: විල්පිට වත්ත කම්බි අඩිය; ඉඩමේ විස්තර ගෙවතු මාර්ගය සහ ලඳු කැලය; හිමිකම් කියන අය : ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව, තැ. පෙ. 1526, අංක ජී 82, හෙක්ටර් කොබ්බෑකඩුව මාවත, කොළඹ 07; ප්‍රමාණය: 23.1977 හෙක්ටයාර්.

**02. කැබලි අංක 697**

ඉඩමේ නම: විල්පිට වත්ත කම්බි අඩිය; ඉඩමේ විස්තර: ගෙවත්ත මිශ්‍ර වගාවක් ඇත; හිමිකම් කියන අය : ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව, තැ. පෙ. 1526, අංක ජී 82, හෙක්ටර් කොබ්බෑකඩුව මාවත, කොළඹ 07; ප්‍රමාණය :0.0568 හෙක්ටයාර්.

ඉහත සඳහන් ඉඩමට/පරවශ්‍යතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2017 දෙසැම්බර් මස 05 වැනි දින පූ. භා. 10.00 ට අතුරලිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2017 නොවැම්බර් මස 27 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශ්‍යතාව ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ ආකාරයත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය. අයිතිවාසිකම් තහවුරු කිරීමට ඇති සියලු ඔප්පු තිරප්පු හා වෙනත් ලියවිලි විභාගයට ඉදිරිපත් කළ යුතු ය.

දීපිකා කේ. ගුණරත්න,
ප්‍රාදේශීය ලේකම් (වැ. බ.),
අතුරලිය.

2017 ඔක්තෝබර් මස 30 වැනි දින,
අතුරලිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

11-986


1A - G 26561 - 19 - (2017/11)
*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.